**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 7**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 6.2.3.රෆායල් සන්සියෝ ශිල්පියාගේ නිර්මාණ අගයමු(I) |

**ඉගෙනුම් අත්වැල**

## රෆායල් සන්සියෝ(Raphael Sansiyo)



- පුනර්ජීවන යුගයේ විසූ ශ්‍රේෂ්ඨ චිත්‍ර ශිල්පියෙකි.
- වර්ෂ 1483 ඌර්බිගෝ නමැති නගරයේ උපත ලබා ඇත.
- ඇතැන්ස් ගුරුකුලය(School of Athens), මැඩෝනා චිත්‍ර, තණ පිටියේ සිටින මැඩෝනා(Madonna of the Meadows) ,මැඩෝනා ඩෙලා සේදියා(Madona Della sediya )යන සිතුවම් රෆායල්ගේ සිතුවම් අතර වැදගත් නිර්මාණයන් ය.

## ඇතැන්ස් ගුරුකුලය (school of Athens)



- රෆායල් ගේ විශිෂ්ට බිතුසිතුවමක් වේ.
- ෆ්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කර ඇත.
- රෝමයේ ස්ටැන්සා ඩෙලා සිගන්චුරා (Stanze della Segnatura) නමැති ගොඩනැගිල්ලේ බිත්තියක ඇඳ ඇත.
- විචාරකයන් පවසන පරිදි වාස්තු විද්‍යාත්මක අවකාශය මත රූප සම්පිණ්ඩනය කිරීම පිළිබඳව දක්වා ඇති කුසලතාව සහ ප්‍රතිභාව නිර්මාණකරණයේ අග්‍රඵලයක් බවයි.
- මෙම සිතුවමින් දැක්වෙන්නේ පැරණි ග්‍රීක දාර්ශනික ඇතැන්ස් ගුරුකුලයයි.
- සිතුවමේ මැද ඇරිස්ටෝටල් හා ප්ලේටෝ යනු දාර්ශනිකයන් දෙදෙනා ය. සෙසු දාර්ශනිකයන් වාද විවාදවල පැටලී සිටින අයුරු දක්වා ඇත.
- දාර්ශනික ලෝකය ක්‍රියාකාරී මානව රූප සම්පිණ්ඩනය මගින් ඉදිරිපත් කර තිබීම මෙම සිතුවමේ දැකිය හැකි විශේෂතාවකි.
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද,අඳුරු කහ වර්ණ වල විවිධ ප්‍රභේද, රතු සහ සුදු යන වර්ණ සිතුවම සඳහා භාවිත කර ඇත.

**ක්‍රියාකාරකම**

1. රෆායල් සන්සියෝ උපත ලබා ඇත්තේ කොහේදීද ?කුමන වර්ෂයේදී ද?
2. රෆායල්ගේ සිතුවම් තුනක් නම් කරන්න.
3. ඇතැන්ස් ගුරුකුලය නම් සිතුවම නිර්මාණය කර ඇත්තේ කොහේද?
4. මෙම සිතුවමෙන් දැක්වෙන්නේ කුමක්ද ?
5. මෙම සිතුවමේ සිටින සුප්‍රකට දාර්ශනිකයන් දෙදෙනා කවුද?
6. ඇතැන්ස් ගුරුකුලය නම් සිතුවම් පිළිබඳ සරල විස්තරයක් ලියන්න.ඒ සඳහා පහත කරුණු ද ද අන්තර්ගත කර ගන්න(ශිල්ප ක්‍රමය ,වර්ණ භාවිතය,මානව රූප භාවිතය)

**පැවරුම.- රෆායල් සන්සියෝ නම් චිත්‍ර ශිල්පියා පිළිබඳව වැඩිදුර තොරතුරු එකතු කරන්න.**